| | |
|---|---|
| කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර | බහුවරණ ප්‍රශ්න සංග්‍රහය |
| විෂය- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | ශ්‍රේණිය - 12 |
| සකස් කළ ගුරුභවතාගේ නම - කේ.යූ.කරුණාරත්න මිය<br>පාසල - ර/ ශාන්ත ඇලෝසියස් විද්‍යාලය | පාඩම - 11.විද්‍යාත්මක විධි ක්‍රම |

**(01) අවයව සත්‍ය වන විට සත්‍ය වීමට සම්භාවිතාවයක් ඇති නිගමන ලබා දෙන අනුමානය වන්නේ,**

(i) උද්ගමනවාදය යි.
(ii) නිගාමී සත්‍යොක්ෂණ වාදය යි.
(iii) නිගාමී අසත්‍යොක්ෂණවාදය යි.
(iv) සාපේක්ෂක වාදය යි.
(v) පර්යේෂණ වැඩසටහන් විධික්‍රමය යි.

**(02) උද්ගමනය නමින් ගත හැකි තර්කයක් හෝ අනුමානයක් නැතැයි යන අදහස දරූ යේ,**

(i) කාල් හෙම්පල් ය.
(ii) ඉම්රි ලකටෝස් ය.
(iii) කාල් පොපර් ය.
(iv) තෝමස් කූන් ය.
(v) පෝල් ෆයරාබන්ඩ් ය.

**(03) විධික්‍රමයේ දී අවස්ථාවෝචිත උපන්‍යාස යොදා නොගත යුතු යැයි ප්‍රකාශ කළ විධික්‍රමවාදීන් යුගලය වන්නේ,**

(i) කාල් හෙම්පල් හා කාල් පොපර් ය.
(ii) කාල් පොපර් හා ඉම්රි ලකටෝස් ය.
(iii) තෝමස් කූන් හා පෝල් ෆයරාබන්ඩ් ය.
(iv) පෝල් ෆයරාබන්ඩ් හා කාල් පොපර් ය.
(v) තෝමස් කූන් හා ඉම්රි ලකටෝස් ය.

**(04) ෆයරාබන්ඩ් විද්‍යාව හා ක්‍රමවේදය පිළිබඳ දරණ ආකල්පයක් ලෙසින් ගත නොහැක්කේ මෙයින් කුමක් ද?**

(i) විද්‍යාත්මක සොයා ගැනීම් තුළ දී සබුද්ධිකත්වය පිළිබඳ නීතිරීති උල්ලංඝනය කළ නොහැක.
(ii) න්‍යායකට අත්දැකීමෙන් හා නිරීක්ෂණයෙන් ස්වාධීන වූ අර්ථයක් ඇත.
(iii) න්‍යායික අරාජිකවාදය නිශ්චිත නීතිරීති ඇති විධික්‍රමයකට වඩා විද්‍යාවේ ප්‍රගතියට තුඩු දේ.
(iv) රාජ්‍යය හා විද්‍යාව එකිනෙකින් වෙන් කළ යුතුය.
(v) විද්‍යාත්මක විප්ලවයන්හි දී සම්මතයන්, සම්ප්‍රදයන්, නීතිරීති ප්‍රමිතීන් මායිම් කර නැත.

**(05) තෝමස් කූන්ට අනුව විප්ලවයකින් පැරඩයිම මාරුවකට යෑම,**

(i) සබුද්ධික ක්‍රියා මාර්ගයකි.
(ii) විද්‍යාඥ ප්‍රජාව ප්‍රයෝජ්‍යතාවාදී ව ඇති කරගත් සම්මුතිය යි.
(iii) සාමාන්‍ය විද්‍යා අවධිය තුළ ලක්ෂණයකි.
(iv) සහේතුක යථාර්තය ග්‍රහණය කිරීමකි.
(v) විද්‍යාව අවශ්‍යයෙන්ම සත්‍ය කරා මෙහෙයවන ක්‍රියා මාර්ගයකි.

**(06) කූන්ට අනුව පදනම් වාදය සම්බන්ධ වැරදි ප්‍රකාශය කුමක් ද?**

(i) එය සාකල්‍යය
(ii) සුචිත ඥනයකි.

(iii) විෂය බද්ධ න්‍යායකි. (iv) මුළු විද්‍යා ක්ෂේත්‍රයම ආවරණය කරයි.

(v) අධිතල වාදයකි.

**(07) සාපේක්ෂකවාදීන් සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය කුමක් ද?**

(i) ප්‍රත්‍යක්ෂ ඇතුලු නිරීක්ෂණ භාෂාවේ අවිචල්‍ය ස්වභාවය බැහැර කරයි.

(ii) විද්‍යාත්මක ක්‍රමය ලෙස ගත හැකි නිශ්චිත යමක් නැත.

(iii) විද්‍යාව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මත පදනම් වූ නිශ්චිත දත්ත ඇසුරින් ගොඩනැගුණු ඥනයක් පමණක් නොවේ.

(iv) විද්‍යාව, ක්‍රමයෙන් ප්‍රගතිය කරා ගමන් ගන්නා සත්‍ය කරා ආසන්න වන ක්‍රියාදමයකි.

(v) පූර්ව වාදය හා පශ්චාත් වාදය අතර සම්බන්ධතාවයක් දැකිය නොහැක.

**(08) පහත a හි දැක්වෙන ග්‍රන්ථය b හි දැක්වෙන රචකයා හා සම්බන්ධ කළ විට නිවැරදි පිළිතුර වන්නේ,**

| (a) | (b) |
|---|---|
| (i) විද්‍යාත්මක විප්ලවයේ ව්‍යුහය | [A] ඉම්රි ලක්ටෝස් |
| (ii) විද්‍යාත්මක සොයා ගැනීමේ තර්කය | [B] පෝල් ෆයරාබන්ඩ් |
| (iii) අත්දැකීමෙන් තොර විද්‍යාව | [C] තෝමස් කුන් |
| (iv) අසත්‍යකරණය සහ විද්‍යාත්මක පර්යේෂණ වැඩපිළිවෙලේ ක්‍රමවේදය | [D] කාල් පොපර් |

(i) C D A B (ii) D A C B (iii) A D B C (iv) A D C B (v) C D B A

**(09) නිගාමී සත්‍යොක්ෂණවාදය මගින් සනාථ කළ මතවාදයක් නොවන්නේ කුමක් ද?**

(i) ආලෝකය පිළිබඳ මතවාද (ii) බොයිල් නියමය

(iii) පරිණාමවාදය (iv) සාමාන්‍ය සාපේක්ෂතාවාදය

(v) ගුරුත්වාකර්ෂණවාදය

**(10) පොපර්ට අනුව විද්‍යාවට අවශ්‍ය වන්නේ,**

(i) පදනම්වාදයන් ය.

(ii) නව අනාවැකිය.

(iii) අසත්‍යකරණ ක්‍රියාවලියකි.

(iv) නිර්භය ඌහනයන් සහ නව අනාවැකි දෙන උපන්‍යාසයන් ය.

(v) සම්භාවිතාවයෙන් වැඩි උපන්‍යාසයන් ය.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 1 | 6 | 5 |
| 2 | 3 | 7 | 4 |
| 3 | 2 | 8 | 5 |
| 4 | 1 | 9 | 3 |
| 5 | 2 | 10 | 4 |